## 19 ඉවත් කොට 20 වන සංශෝධනය ගෙන ඒමෙන් රටට යහපතක් සිදුවේද?

# 20 නිවැරදි කරන්නේ කෙසේද?

රනිල් වික්‍රමසිංහ මහතා 19 වන සංශෝධනය ගෙන ආවේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමට නොව ජනාධිපති සතු විධායක බලතල පැහැර ගෙන විධායක අගමැතිවරයකු වීම සඳහා ය. එහෙත් එය වැළකුනේ ඊට පක්ෂව ඡන්දය දුන් මන්ත්‍රීවරුන්ගේ හපන්කමක් නිසා නොව කෙටම්පතේ අඩංගුව තිබූ යම් යම් වගන්ති ජනමත විචාරනයකින් තොරව සම්මත කළ නොහැකි යයි ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුව නිසා ය. ඇත්ත වශයෙන්ම රනිල් වික්‍රමසිංහ මහතාට බටහිර බලවේග විසින් එම කැරට් අලය ලබා දෙන්නේ අවසාන වශයෙන් රාජ්‍යය දුර්වල කිරිමේ අරමුණ සහිතවය. ඒ අනුව 19 නිසා සිදු වුයේ ජනාධිපති, අගමැති හා කථානායක වශයෙන් බල කේන්ද්‍ර තුනක් ඇති වී ජනාධිපතිට විධායක බලය නිසියාකාරව ක්‍රියාත්මක කළ නොහැකි වී රට අස්ථාවර වීමයි.

## සිදු වුයේ කුමක්ද?

විපක්ෂය කියන පරිදි 19 නිසා රටේ ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදයක් හෝ 19 ඉවත් කිරීම නිසා රටට අහිමි වන ප්‍රජාතන්ත්‍රවාදයක් නැත. ජනාධිපති සතු විධායක බලය අදිසි විදෙස් හස්තයන් මගින් හසුරුවන එන්.ජී.ඕ කාරයින්ගේ බලපෑමට යටත් ව්‍යවස්ථා සභාවට පැවරීම ප්‍රජාතන්ත්‍රවාදය ද? ව්‍යවස්ථා සභාව ස්වාධීන ද? ව්‍යවස්ථා සභාව මගින් පත් කරන ලද කොමිෂන් සභා ස්වාධීන ද? පොලිස් කොමිසම, මානව හිමිකම් කොමිසම ස්වාධීන ද? නීතිය හා සාමය බිඳ වැටී රට අරාජික වීම, පාස්කු ප්‍රහාරය, පොලිස්පති හිරේ යාම, දේශපාලන පලි ගැනීම් සඳහා බොරු නඩු පැවරීම, විනිසුරුවරුන් උසස් වීම් ලබා ගැනීම සඳහා රන්ජන් රාමනායක වැන්නන් ගෙන් උදව් පැතීම, රටට එරෙහිව විදෙස් රටවලට ගතු කියන එන්.ජී.ඕ කාරයින් ගෙන් කොමිෂන් සභා පිරවීම වැනි දේ හැර 19 නිසා රටේ ජනතාවට ලැබුනු ප්‍රජාතන්ත්‍රවාදය කුමක් ද?

## කළ යුතු දේ කුමක්ද?

ජනතා පරමාධිපත්‍යයෙන් ජනාධිපති තුමාට පැවරී ඇති විධායක බලය උදුරා ගනිමින් 19 මගින් පනවා ඇති බාධක වහා ඉවත් කළ යුතු ය. මේ බාධක පනවා ඇත්තේ ප්‍රධාන වශයෙන් ම 19 ඇති වගන්ති දෙකකිනි. ඒ ව්‍යවස්ථා සභාව පිහිටුවන 19 යේ (41 A සිට 41 I දක්වා වන ව්‍යවස්ථාවන් ඇතුළත්) 8 වන වගන්තියෙන් සහ 78 ව්‍යවස්ථාවේ විධායකයේ ඇමති මණ්ඩලය ගැන සඳහන් වන ජනාධිපතිට ඇමති ධුර දැරීමේ හා අගමැති ඉවත් කිරීමේ බලය ඇතුළත් VIII වන පරිච්ජේදය ඉවත් කොට ජනාධිපතිට ඇමති ධුර දැරීමේ හා අගමැති ඉවත් කිරීමේ බලය නැති (42 සිට 52 දක්වා වන ව්‍යවස්ථාවන් ඇතුළත්) අලුත් VIII වන පරච්ජේදයක් වංචනික ලෙස එතැනට රිංග වූ 9 වන වගන්තියෙනි. මේ වගන්ති දෙක ඉවත් කොට ව්‍යවස්ථා සභාව මගින් කොමිෂන් සභා හා ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීමට අදාල වගන්ති වල තිබෙන ''**ව්‍යවස්ථා සභාවේ නිර්දේශයන්ට යටත් ව**'' යන වචන ඛණ්ඩය ඉවත් කොට ඒ වෙනුවට ''**පාර්ලිමේන්තු සභාවේ නිර්දේශයන් ද සළකා බලා**'' යන වචන ඛණ්ඩය යෙදුවේ නම් ජනාධිපති තුමාට පත් කිරීම් සිදු කිරීමේ විධායක බලය ආපසු ලැබෙන අතර විපක්ෂයට ද ප්‍රජාතන්ත්‍රවාදය නැති කළේ යයි සෝෂා කිරීමට තිබෙන ඉඩකඩ ද අඩු වනු ඇත.

## නොකළ යුතු දේ කුමක්ද?

ආණ්ඩුව 19 ඉවත් කිරීමට 20 වන සංශෝධනය ගෙනවුත් ඇත. 20 ගෙනවුත් ඇත්තේ 18 නැවත පන ගැන්වීමට බව ආණ්ඩුව කියයි. 19 මගින් කොමිෂන් සභා හා ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීමේ ජනාධිපති සතු බලතල උදුරා ගන්නා අතරම ඒ බලතල ක්‍රියාත්මක කිරීමේදී සැළකිල්ලට ගතයුතු සාධනීය කරුණු ගණනාවක් ද එයට ඇතුළත් කර තිබුණි. බලතල ක්‍රියාත්මක කරන්නේ කවුරුන් වුවද ඒ සාධනීය කරුණු සැළකිල්ලට ගැනීමෙන් යහපතක් මිස අයහපතක් සිදු නො වේ. එහෙත් 20 මගින් 19 ඉවත් කිරීමේදී ආණ්ඩුව 19 යේ තිබූ හානිකර දේ මෙන් ම බොහෝ සාධනීය කරුණු ද ඉවත් කර ඇත. සැබෑ අරමුණු සගවමින් මහජනයා රැවටීම සඳහා වුවත් 19ට ඇතුලත්කර තිබූ යහපත් දේ රැකගනිමින් එහි තිබෙන විෂ ඉවත් කිරිම ආණ්ඩුවේ වගකීම වේ.

## 19 තිබූ ඉවත් කළ යුතු නරක දේ

ජනාධිපතිගේ විධායක බලයට සීමා පනවන 19 වන සංශෝධනයේ තිබෙන අහිතකර අංග වන්නේ (අ). කොමිෂන් සභා හා ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීමේ ජනාධිපති සතු විධායක බලය ජනාධිපතිට අහිමි කොට එන්.ජී.ඕ කාරයින්ගේ බලපෑමට යටත් ව්‍යවස්ථා සභාව අතට පත් කිරීම (ආ) ව්‍යවස්ථාවේ viii වන පරිච්ඡේදය ඉවත් කොට එතැනට අලුතෙන් පරිච්ඡේදයක් වංචනික ලෙස රිංගවා ජනාධිපතිට ඇමති ධුර දැරීමේ හා අගමැති ඉවත් කිරීමේ බලය අහිමි කිරීම (ඇ) අවුරුදු හතර හමාරක් යන තුරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිට අහිමි කිරීම. මේවා ඉවත් කළ යුතු ය. 20 න් මේවා ඉවත් කිරීමට යෝජනා කර ඇත.

## 19 තිබූ රැක ගත යුතු සාධනීය කරුණු

ජනාධිපතිගේ විධායක බලයට සීමා පනවන අතර ම ජනතාවගේ පැත්තෙන් බලන විට සාධනීය ලෙස පෙනෙන කරුණු ගණනාවක් ද 19 ට ඇතුළත් වී තිබුණි. කවර චේතනාවකින් ගෙන ආවද ඒවා ජනතාවට ප්‍රයෝජනවත් විය හැකි දේ ය.

- තොරතුරු ලබා ගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් බවට පත් කිරීම
- පාර්ලිමේන්තු කාලය වසර පහකට සීමා කිරීම
- ජනාධිපති ධුර කාලය වසර පහකට සීමා කිරීම යන කරුණු තුන 20 න් රැක ගෙන ඇත.
- එහෙත් 19 තිබූ අන් සියලු සාධනීය කරුණු 20 න් බැහැර කර ඇත.

## නමුත් 20 න් බැහැර කර ඇති සාධනීය කරුණු

01. පාර්ලිමේන්තුවට පනතක් ඉදිරිපත් කිරීමට දින 14 කට පෙර එය ගැසට් පත්‍රයේ පළ කළ යුතු වීම. එය දින 7 දක්වා අඩු කර ඇත. (15 වන වගන්තිය)

02. 19 මගින් ඉවත් කොට තිබූ ගැසට් පත්‍රයේ පළ නොකොට ජනතාවට හොරෙන් පැය 24 කින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසා **හදිසි පනත් ගෙන ඒමේ බලය** 20 මගින් නැවතත් ජනාධිපතිට පවරා දීම. (27 වන වගන්තිය )

    - චන්ද්‍රිකා කුමාරණතුංගගේ පාලන සමයේ 2004 - 2005 අතර කාලය තුල මෙවැනි පනත් 8 ක් ගෙනවුත් තිබුණි. ඒවා එකක් වත් ජාතික වශයෙන් වැදගත් හදිසි පනත් නොව සාමාන්‍ය පනත් ය.
    - මෙය ඉතා භයානක දෙයකි. මේ බලය ව්‍යවස්ථාවේ තිබුණොත් එම්.සී.සී ගිවිසුම, එට්කා ගිවිසුම වැනි දේ පවා ජනතාවගේ ඇස් වසා හදිසි පනත් ලෙස සම්මත කර ගැනීම වැළැක් විය නොහැකි වනු ඇත.

03. 20 මගින් 19 න් පිහිටුවා ඇති **විගණන සේවා කොමිෂන් සභාව** අහෝසි කොට විගණන නිලධාරීන්ගේ විනය පාලනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරා ඇත. (32-39 වන වගන්ති)

    - රාජ්‍ය ආයතන වල සිදුවන දූෂනය හා නාස්තිය අවම කොට මහජන දේපොල රැක ගැනීම සඳහා ශක්තිමත් කාර්යක්ෂම හා ස්වාධීන විගණන සේවයක් අත්‍යාවශ්‍ය ය. දැනටමත් විගණන නිලධාරීන් මහ නාහිමිවරුන් හමුව එයට සිය විරෝධය පළ කොට ඇත.
    - මෙහි අනිවාර්ය ප්‍රතිඵලය විගණන සේවය දුර්වල වී රාජ්‍ය ආයතන වල සිදුවන දූෂනය හා නාස්තිය උත්සන්න වීමයි.

04. 19 න් පිහිටුවා ඇති **ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව** 20 මගින් අහෝසි කොට ඇත.

    - රාජ්‍ය ආයතන වලට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීමේදී දූෂන වැළැක් වීම සඳහා ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අත්‍යාවශ්‍ය ය.
    - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ඉවත් කරන්නේ මක් නිසාද?

05. විගණකාධිපති ධුරයට **නිසි සුදුසුකම් සහිත විගණක නිලධාරියකු** පත් කිරීම. 20 න් **නිසි සුදුසුකම් සහිත විගණක නිලධාරියකු** යන්න ඉවත් කර ඇත. (31වන වගන්තිය)

- ඉන් අදහස් වන්නේ විගණනය ගැන කිසිදු දැනුමක් නැති පුද්ගලයකු විගණකාධිපති වශයෙන් පත් කළ හැකි බව ද?

06. 19 අනුව ජනාධිපති ලේකම් කාර්යාලය අගමැති ලේකම් කාර්යාලය ඇතුළු සියලු රාජ්‍ය ආයතන විගණකාධිපතිගේ විගණනයට යටත් වේ. 20 මගින් **ජනාධිපති ලේකම් කාර්යාලය** හා **අගමැති ලේකම් කාර්යාලය** ද කොටස් වලින් 50% කට වඩා රජයට හෝ රාජ්‍ය සංස්ථා වලට හෝ පලාත් පාලන ආයතන වලට හිමි **සමාගම් පනත යටතේ ලියා පදිංචි කොට ඇති සමාගම්** ද විගණකාධිපතිගේ **විගණනයෙන් බැහැර කොට** ඇත. (40 වන වගන්තිය)

- මේ නිසා ආයතන 150 ක් රාජ්‍ය විගණනයෙන් බැහැර වන බවත් ඒ නිසා පාර්ලිමේන්තුවටවත් ඒවා ගැන සොයා බැලීමට ඉඩක් නො ලැබෙන බවත් විගණකාධිපති තුමා දැනටම ත් පවසා ඇත.
- මේ ආයතන විගණනයෙන් බැහැර කිරීම කාගේ අවශ්‍යතාවයක් ද?

07. **ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමේ** හෝ ජනාධිපති ධුරයට තරඟ කිරීමේ අවස්ථාව 19 මගින් අහිමි කර ඇත. 20 න් මේ **තහනම** ඉවත් කර ඇත.

- මෙය පුද්ගලයන් ඉලක්ක කර ගෙන කළ ද නරක දෙයක් නොව හොඳ දෙයකි. අපේ ජනාධිපති තුමා කළා ක් මෙන් විදේශ පුරවැසි භාවය ඉවත් කර ගෙන ඉදිරිපත් වීමට කිසිවකුට බාධාවක් නැත.
- විදේශ පුරවැසියකු පාර්ලිමේන්තුවට පත්වුව හොත් ඔහුට ඇමතිවරයකු වීමටත් බාධාවක් නැත. විදේශ පුරවැසියන් රටේ විධායක බලය හිමි අමාත්‍ය මණ්ඩලයේ සිටියොත් කුමක් සිදුවේ ද?
- විදේශ පුරවැසි භාවයේ නුසුදුසු කම නැති කරනවා වෙනුවට ඉහළ රාජ්‍ය නිලධාරි තනතුරු දක්වා ද දික් කළ යුතු ය. අර්ජුන මහේන්ද්‍රන්ලා, හූල් ලා පත් කිරීමෙන් සිදු වූ දේ අප දැනටමත් දැක ඇත.

08. 20 මගින් ව්‍යවස්ථා සභාව ඉවත් කොට ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාවක් පිහිටු වුව පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ නො මැතිව ජනාධිපති වරයාට තනි මතයට කොමිෂන් සභා වල සාමාජිකයන් හා ඉහළ නිලධාරීන් පත් කිරීමටත් ඉවත් කිරීමට ත් බලය ලබා දී ඇත. එය හිතකර දෙයක් නොවේ.

- 19 ට අනුව ඒ සියලු පත් කිරම් හා ඉවත් කිරීම් සිදු කළ යුතු වූයේ ව්‍යවස්ථා සභාවේ නිර්දේශ අනුව ම ය. ඉන් බැහැර වීමට ජනාධිපතිට නො හැකි විය. එය ජනාධිපතිගේ විධායක බලයට අනිසි ලෙස අත පෙවීමකි.
- 20 න් පත් කෙරෙන්නේ ව්‍යවස්ථා සභාවක් නොව පාර්ලිමේන්තු සභාවකි. ජනාධිපති පත් කිරීම් හා ඉවත් කිරීම් සිදු කිරීමේදී පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ අනුව කටයුතු නො කළ ද ඒ නිර්දේශ සළකා බැලීම වරදක් නොවේ. එයින් එය ජනාධිපතිගේ විධායක බලයට සීමාවක් නොපැන වේ. එය වඩාත් සුදුසු පුද්ගලයින් තෝරා ගැනීමට ඉවහල් වනු ඇත. එසේ නොවේ නම් පාර්ලිමේන්තු සභාව පත් කිරීම තේරුමක් නැති දෙයක් බවට පත් වේ.

09. 19 අනුව අධිකරණ සේවා කොමිසමට සාමාජිකයන් පත් කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨම හා පහළ උසාවි වල වැඩ කොට පලපුරුදු විනිසුරු වරුන් ඒ සඳහා පත් කළ යුතු විය.

- මෙය 19 තිබූ යහපත් කරුණකි. ඒ පත් කිරීම් සිදු කිරීමේදී සලකා බැලිය යුතු අවශ්‍ය නිර්ණායක දෙකකි. එහෙත් 20 න් මෙය ඉවත් කොට ඇත. (23 වන වගන්තිය) ඒ අනුව ජ්‍යෙෂ්ඨත්වය හා පහළ උසාවි වැඩ පිළිබඳ පලපුරුද්ද නොසලකා ඕනෑම විනිසුරු වරුන් දෙදෙනෙකු පත් කළ හැකි ය.

10. පොලිස් නිලධාරීන්ගේ බඳවා ගැනීම හා විනය පාලනය ජාතික පොලිස් කොමිසමෙන් ඉවත් කොට රාජ්‍ය සේවා කොමිසමට පැවරීමෙන් හා ජාතික පොලිස් කොමිසම පොලිස් නිලධාරීන්ට එරෙහි

මහජන පැමිණිලි විමසීම පමණක් සිදු කරන ආයතනයක් බවට පිරි හෙළා එය වැඩක් නැති ආයතනයක් බවට පත් කොට ඇත. (46 වන වගන්තිය)

11. 19 අනුව ඇමතිවරුන් හා අමාත්‍යාංශ ලේකම් වරුන් සිය තනතුරු වල වැඩ බාර ගැනීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකින බවට 4 වන උපලේඛනය යටතේ ත් රට බෙදීමට උදව් නො කරන බවට 7 වන උපලේඛනය යටතේ ත් දිව්රුම් දිය යුතු ය. - (53 වන ව්‍යවස්ථාව)
එහෙත් 20 අනුව ඇමතිවරුන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් සිය තනතුරු වල වැඩ බාර ගැනීමට පෙර කළ යුත්තේ 4 **වන උපලේඛනයේ** සඳහන් දව්රුම් දීම පමණකි. (53 වන වගන්තිය)

12. ඊට අමතරව පසුගිය කාලයේදී එන්.ජී.ඕ කාරයන් විසින් නිර්මානය කළ මතවාද නිසා දැන් මහජන උවනාවක් බවට පත්වී ඇති 19 ඇතුල් කොට තිබූ අමාත්‍යවරුන් සීමා කිරිමේ ප්‍රතිපාදනය 20න් ඉවත් කිරීම්ද වරදක් ලෙස සැලකිය හැක. එසේ වුවත් ජාතික සංවිධාන වල මතය වන්නේ සුදුසුකම් සහිත මන්ත්‍රීවරුන් වැඩි පිරිසකට වගකීම් පවරා ඔවුන්ට ලබා දෙන වරප්‍රසාද සහ ප්‍රතිලාභ අඩුකිරිම මගින් මහජනයාට ලැබෙන ප්‍රතිලාභ වැඩි කිරිමය.

**20 වන සංශෝධනය මගින් ආණ්ඩුවේ සතුරන්ට ආණ්ඩුවට පහර ගැසීම සඳහා ඕනෑවටත් වඩා ආයුධ සපයා ඇත. එහෙත් එසේ කිරීමෙන් තොරව දේශපාලන හා සමාජ යථාර්ථයන් තේරුම් ගෙන ජනාධිපති තුමාගේ දෑත් සවිමත් කිරීමට අවශ්‍ය ආකාරයට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කෙරුනා නම් ආණ්ඩුවේ සතුරන්ට මේ ආකාරයට ආණ්ඩුවට පහර ගැසීමට නොහැකි වනු ඇත.**

**කෙටුම්පත සකස් කිරිමේ වගකීම මහජනයාට වග කියන සහ ජනාධිපතිතුමාගේ ජනවරම පිළිබඳ ගැඹුරු අවබෝධයක් තිබෙන පිරිසකට බාර දුන්නා නම් මෙම අනවශ්‍ය තත්වය ඇති නොවන බව පැහැදිලිය. නමුත් නිහතමානිව වැරදි නිවරදි කිරිම මගින් ජනාධිපතිතුමාගේ අවංක ප්‍රතිරූපය ආරක්ෂා කර ගත හැක.**

**ඊට අමතරව නව ව්‍යවස්ථාව සකස්කිරීමේදි එම වරද නැවත සිදුනොවන බවට වග බලා ගැනීමද වැදගත් වනු ඇත.**

**නොවැබර් 16 ජනවරම ආරක්ෂා කරමු !**

**වැරදි නිවරදි කිරිම මගින් නව ව්‍යවස්ථාවක් සඳහා මහජන විශ්වාශය තහවුරු කරමු!**

**අසරණව සිටින රටට හතුරු බලවේග වලට ආණ්ඩුවට විරුද්ධව භාවිතා කිරිම සඳහා ආයුධ ලබා නොදෙමු!**

**20 වැනි සංශෝධනයේ අත්‍යාවශය නිවරදි කිරිම් සිදුකොට නැවත ගැසට් කිරිම මගින් පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී කුමන්ත්‍රණ කිරිමට සතුරාට ඇති අවස්ථාව අහිමි කරමු!**

**ජාතික සංවිධාන එකමුතුව**
**(නිති උපදේශනය ජ්‍යෙෂ්ඨ නීතිඥ කල්‍යානන්ද තිරාණගම)**